**තලාව ප්‍රාදේශීය සභාව - 2023**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තලාව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට තලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී ඉදිකළ වටිනාකම රු.13,380,968 ක් වූ මාර්ග 10 කට අදාළ 2022 වර්ෂයේ ක්ෂය රු.1,338,097 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි ක්ෂය වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | තලාව Green City ව්‍යාපෘතිය යටතේ 2023 දෙසැම්බර් 31 දිනට සහතික කළ රු.5,981,077 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම් හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ප්‍රාග්ධනිත කළයුතු වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේදී නල ළිඳක් සහ වතුර ටැංකියක් ඉදිකිරීමේ වියදම් රු.1,210,425 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | 2022 වර්ෂයේදී ගෙවීම් කරන ලද ව්‍යාපෘති 04 කට අදාළ රු.7,291,898 ක වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | දේපළ, පිරියත හා උපකරණ සහ ප්‍රාග්ධන ප්‍රදාන හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.22,477,373 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.11,591,444 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව වෙත ලැබී තිබූ උසාවි දඩ, මුද්දර ගාස්තු ආදායම් රු.37,250,000 ක් ජනතාවගේ අවශ්‍යතා ඉටුකිරීම සඳහා නොයොදා සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ඉදිරි කාලයේදී සංවර්ධන කටයුතු සඳහා එම මුදල් යෙදවීමට කටයුතු කරන බව. | බල ප්‍රදේශයේ අත්‍යවශ්‍ය කාර්යයන් වෙනුවෙන් මුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 13,438,659 | 15,391,286 | 15,151,557 | 22,571,661 | 13,100,493 | 14,183,776 | 14,662,751 | 22,331,932 |
| (ii) | කුලී | 16,571,200 | 14,251,837 | 15,564,280 | 4,138,014 | 21,132,744 | 13,622,075 | 14,677,552 | 5,450,457 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,618,650 | 4,352,086 | 4,863,086 | 138,150 | 4,221,400 | 4,230,756 | 4,657,114 | 649,150 |
| (iv) | වෙනත් ආදායම් | 31,854,111 | 34,772,413 | 19,168,431 | 33,498,332 | 25,743,850 | 28,774,180 | 19,138,164 | 17,894,350 |
| | | 66,482,620 | 68,767,622 | 54,747,354 | 60,346,157 | 64,198,487 | 60,810,787 | 53,135,581 | 46,325,889 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බිල් කිරීම රු.6,240,417 ක් වූ නමුත් එයින් සියයට 52 ක් වූ රු.3,082,766 ක් අයකරගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2023 ජනවාරි 01 දින වන විට පූර්ව වර්ෂවලට අදාළව හිඟ වරිපනම් රු.19,918,933 ක් පැවති නමුත් සමාලෝචිත වර්ෂයේදී එයින් සියයට 87 ක් වූ රු.17,242,538 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් කඩිනමින් අයකිරීමට කටයුතු යොදා ඇති බව. | -එම- |
| (iii) | ආයතන 32 කට අදාළ හිඟ කර්මාන්ත බදු රු.20,750 ක් ද, ආයතන 184 කට අදාළ හිඟ ව්‍යාපාර බදු රු.178,800 ක් ද, 2023 දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි. | අයකිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ආ) | **කුලී** | | |
| (i) | සභාවට අයත් කඩ කාමර වෙනුවෙන් ලැබිය යුතු කුලී රු.2,431,639 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදලින් කොටසක් අයකරගෙන ඇති බව හා ගිවිසුම් අස්ථාන ගතවී ඇති බැවින් ඉතිරි හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇත. | -එම- |
| (ii) | වෙළඳ අයිතිය බදුදීම වෙනුවෙන් වසර 01 ත් 08 ත් කාලයක සිට අයවිය යුතු හිඟ කුලී රු.1,265,976 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බව. | -එම- |
| (iii) | සභාව සතුව ස්ථානයක් නොමැතිව වෙළඳ අයිතිය වෙනුවෙන් ස්ථාන 33 ක් නාමිකව පමණක් බදු දීමට කටයුතු කිරීම නිසා රු.5,778,686 ක හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සභාවට නොහැකි වී තිබුණි. | ඉදිරියේදී එම ස්ථානවල වෙළඳ කුටි ස්ථාපිත කර ආදායම් රැස් කිරීමට කටයුතු කරන බව. | බදු දීමට පෙර අදාළ ස්ථාන සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **වෙනත් ආදායම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | බල ප්‍රදේශයේ පිහිටි ජල ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් ලැබිය යුතු රු.1,738,808 ක් 2023 දෙසැම්බර් 31 වනවිටත් අයකරගෙන නොතිබුණි. | මෙම හිඟ මුදල් වාරික වශයෙන් අයවෙමින් පවතින බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.25,428,442 ක් හා මුද්දර ගාස්තු රු.4,718,481 ක් විය. | මෙම මුදල් ලබාදෙන ලෙස ඉල්ලීම් සිදුකර ඇති බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පිළිගන්නා බව. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | එප්පාවල සතිපොළ ඉදිරිපිට හා නගරයේ හෝටල් ආදිය ඉතා අපවිත්‍රව හා ජනතාවගේ සෞඛ්‍යයට හානිකර අයුරින් පවතින බව නිරීක්ෂණය වූ නමුත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මඟින් එම තත්ත්වයන් පාලනය කිරීමට අවධානය යොමුකර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකිරීමට කටයුතු කරන බව. | මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් යොදවා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 අනාර්ථික ගණුදෙනු

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තඹුත්තේගම සතිපොළ සඳහා 2017 වර්ෂයේදී රු.9,500,000 ක් වැය කර ඉදිකරන ලද ස්ථානය වෙත සතිපොළ රැගෙන යාමට 2023 වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. එම නිසා ඒ සඳහා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් බවට පත්වී තිබුණි. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද පසු විවෘත කිරීමට බලාපොරොත්තු වෙන බව. | විවෘත කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 අප්‍රේල් 15 දින අනතුරකට ලක්වී තිබුණු සභාවට අයත් කැබ්රථයේ අලාභයෙන් රු.4,458,993 ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට තීරණය කර තිබුණු නමුත් එම මුදල් අයකරගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සභාව විසින් හඳුනාගෙන තිබූ රු.4,018,681 ක අලාභ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පවත්වා එයට වගකිවයුතු පාර්ශව හඳුනාගෙන එම අලාභ අයකිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ලිපිගොනු පරීක්ෂා කර සත්‍ය තොරතුරු ඉදිරිපත් කරන බව. | විධිමත් විනය පරීක්ෂණ පවත්වා අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් තලාව සහ එප්පාවල සතිපොළවල පවතින අඩුපාඩු නිවැරදි කර වෙළඳුන්ට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ලබාදීම, වැට සහ ගේට්ටු සකස්කර පොළ භූමියේ තිබෙන වත්කම් ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. තලාව සතිපොළ භූමියේ ඉදිකර තිබෙන වෙළෙඳ කුටි 100 ක් වෙළඳාම් කිරීම සඳහා යොදවා නොගැනීම නිසා නිෂ්කාර්යව පැවතුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව. | සතිපොළේ අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බල ප්‍රදේශයේ සිදුකරන පදික වෙළඳාම සහ රථගාල් වෙනුවෙන් ගාස්තු අයකර ගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබීම නිසා ඒ තුළින් උපයාගත හැකිව තිබුණු ආදායම් සභාවට අහිමිවී තිබුණි. | සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාවිතයෙන් ඉවත්කර වසර 04 සිට වසර 17 කට අධික කාලයක් ගතවී තිබුණු වාහන 03 ක් අපහරණය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමට කටයුතු කරන බව. | අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවට අයත් වාහන 07 ක්, මාස 03 ත් වසර 10 ත් අතර කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණි. | පිළිගන්නා බව. | වාහන භාවිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 වර්ෂයේදී අනතුරු සිදුවී තිබුණු වාහන 02 කට රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමට සහ වාහන අලුත්වැඩියා කිරීමට පියවරගෙන නොතිබුණි. | -එම- | රක්ෂණ ප්‍රතිලාභ ලබාගැනීම සහ වාහන අලුත්වැඩියා කිරීම සිදුකළ යුතුය. |
| (ඈ) | එප්පාවල පුස්තකාලයේ තිබී අස්ථානගත වී ඇති බවට හඳුනාගෙන තිබුණු පොත් 124 කට අදාළ වටිනාකම් ගණන් බලා වගකිවයුත්තන් හඳුනාගෙන එම අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1. වාෂරීක ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 අයවැය මගින් යෝජිත රු.1,302,654 ක ප්‍රතිපාදන වෙන්කරන ලද ව්‍යාපෘති 07 කින් කිසිම වැඩසටහනක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. | 2024 වර්ෂයේදී අදාළ ව්‍යාපෘති සඳහා යෙදවීමට බලාපොරොත්තු වෙන බව. | යෝජිත ව්‍යාපෘති අදාළ වර්ෂය තුළදී ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුව ආදාහනාගාරය සඳහා අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමට යෝජනා කර තිබුණු නමුත් එම කාර්යය ඉටුකර නොතිබුණි. | නව සභිකයින් පත් වූ පසු ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් කාර්යයන් ඉටු කළ යුතුය. |
| (ඇ) | සභාවට අයිති මාර්ග හඳුනාගෙන ගැසට් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් එම කාර්යය ඉටුකර නොතිබුණි. | ඉදිරියේදී ගැසට් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | 2023 වර්ෂයේදී ඔරුගලයාය පිහිටි කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමට කටයුතු කරන බවට ක්‍රියාකාරී සැලස්මේ සඳහන් කර තිබුණු නමුත් එම කාර්යය ඉටුකර නොතිබුණි. මෙම මධ්‍යස්ථානයට වන අලි පැමිණීම සිදුවන නමුත් ඒ සඳහා අලි වැටක් සකස් කිරීමට කටයුතු නොකිරීම නිසා එහි පවතින දේපළවලට හානි සිදුවී තිබුණි. එමෙන්ම එහි සේවයේ නිරත සේවකයින්ගේ ජීවිතවලට ද තර්ජනයක් වී තිබුණි. | ඉදිරියේදී රුපියල් මිලියන 1.2 ක ප්‍රතිපාදන මේ සඳහා ලැබීමට නියමිත අතර එම මුදල් ලද පසු අදාළ කටයුතු සිදුකරන බව. | -එම- |

## 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඔරුගලයාය පිහිටි කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | 2019 වර්ෂයේදී පරිසර බලපත්‍ර ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ නමුත් කසළ අංගනය වහල සම්පූර්ණ වශයෙන් ඉදිකර නොමැති බැවින් පරිසර බලපත්‍රය ලබාගැනීමට නොහැකි වී ඇති බව. | පරිසර බලපත්‍රය ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |